# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

## මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසුකැඳවීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ, මාතලේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු. අංක | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (බදු රහිතව) (රු) | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර් දින) | ලංසු ආරක්ෂය :රු) |
|---|---|---|---|---|---|
| 01 | **RDA/MTL/CE/RUR/ 2024/CON/01** | දොඩම්දෙණිය මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම | 5,583,206.51 | දින 90 | 27,917.00 |
| 02 | **RDA/MTL/CE/RUR/ 2024/CON/02** | මඩවලදියදහර මාර්ගය ගල් අතුරා තාර දමා සංවර්ධනය කිරීම | 7,862,140.87 | දින 90 | 39,311.00 |
| 03 | **RDA/MTL/CE/RUR/ 2024/CON/03** | උඩුගම ප්‍රධාන මාර්ගය මැද කොටස කාපට් අතුරා සංවර්ධනය කිරීම | 6,870,444.92 | දින 90 | 34,353.00 |
| 04 | **RDA/MTL/CE/WI/ 2024/CON/02** | මාතලේ ඉලුක්කුඹුර ලග්ගල (B 274) මාර්ගයේ බෝක්කු අංක 16/2 – 16/3 අතර Gabion බැම්ම ඉදිකිරීම | 3,543,877.12 | දින 90 | 17,720.00 |
| 05 | **RDA/MTL/CE/WI/ 2024/CON/03** | මාතලේ ඉලුක්කුඹුර ලග්ගල (B 274) මාර්ගයේ බෝක්කු අංක 5/5 – 5/6 අතර ආරක්ෂක බැම්ම ඉදිකිරීම | 4,618,029.66 | දින 90 | 23,090.00 |
| 06 | බෙලගන්වැව - හෙබරව - විල්ගමුව (B 577) මාර්ගයේ කි.මී.6+415 – 7+500 අතර මාර්ග කොටසේ සංවර්ධන කටයුතු සඳහා ඒබීසී කියුබ් 300 ක් ලබා ගැනීම | | | | 10,000.00 |
| 07 | බෙලගන්වැව - හෙබරව - විල්ගමුව (B 577) මාර්ගයේ කි.මී.7+500 – 8+600 අතර මාර්ග කොටසේ සංවර්ධන කටයුතු සඳහා ඒබීසී කියුබ් 300 ක් ලබා ගැනීම | | | | 10,000.00 |
| 08 | මාතලේ ප්‍රධාන ඉංජිනේරු කලාපය තුල කි.මී.1500 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලබන මාර්ග සඳහා ඒබීසී කියුබ් 300 ක් ලබා ගැනීම | | | | 10,000.00 |

2. ලංසු කැඳවීම ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් අතර තරගකාරි ලංසු කරන පටිපාටියට අනුව සිදු කරනු ලබන අතර ඔවුන් මධ්‍යම පළාත් සීමාව තුල ලියාපදිංචි වී තිබිය යුතුය.

3. ඉහත අනු අංක 01 සිට 03 දක්වා වන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමට සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් මාර්ග හෝ පාලම් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශේෂ නිපුණතාව සහිතව **C7** හා **C6** හා අනු අංක **04** හා **05** සඳහා **C8** ශ්‍රේණිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ **(CIDA)** දැනට ලියාපදිංචිවී තිබිය යුතුය.

4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත දැක්වෙන පහත දැක්වෙන කාර්යාලයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීම මෙන්ම කාර්යාල වේලාව තුලදී කිසිදු ගාස්තුවකින් තොරව ලංසු ලේඛණ පරික්ෂාකල හැක.

   අ). ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
   මාර්ග සංවර්ධන අධිකාරිය, මාතලේ. – 066-2230042

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2024.06.03 දින සිට 2024.06.17 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල ආපසු නොගෙවනු ලබන රු.1,210.25 ක (වැට් බදු සහිත ගාස්තුවක්) ගෙවීමෙන් පසු මාතලේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයෙන් ලංසු අයදුම්පත් ලබාගත හැක.

6. ලංසු ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත වියයුතු අතර 2024.09.20 දින දක්වා එහි ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.

7. සම්පූර්ණ කරන ලද ලංසු 2024.06.18 දින පෙ.ව.10.00 හෝ ඊට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මාතලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කරන්න ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුභාර ගැනීම අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයින් ඉදිරියේ එහි ලංසු විවෘත කරනු ලැබේ.

8. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල කොන්ත්‍රාත් අංකය හෝ අදාල සැපයුම පැහැදිලිව සඳහන් කල යුතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
මාර්ග සංවර්ධන අධිකාරිය,මාතලේ.